

හා පැංචා
රැවටුණ හැටි
රනුගි ලසාරා විජේකෝන්

කෘතියේ නම :- හා පැංචා රැවටුන හැටි

කතෘගේ නම :- රනුගි ලසාරා විජේකෝන්

කතෘ අයිතිය ඇතුළු විස්තර :- සියලු හිමිකම් ඇවිරිණි

කතෘගේ වෙනත් කෘති :- මලීගේ හීනය

කෘතිය පළ කරන දින :- 2025.02.08

ISBN NO – 978-624-208-378-0

# පිදුම

## මේ පොත ලිවීමට උපදෙස් දුන් දිල්රුක්ෂි ගුරු මෑණියන්ටත් ආදරණීය දෙමාපියන්ටත් මේ පොත පුදමි...!!!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලයක හා පවුලක් ජීවත් වුණා.ඔන්න හා අම්මයි හා පැංචයි කෑම හොයාගෙන ගියා. ඔන්න ඉතින් ඒ යන කැලෑව අයිනේ පුංචි විලක් තිබුණා.



හා පැංචා විල අයිනට ගියාම විලේ වතුරෙන් එයාගෙම රූපය දැක්කා.අම්මේ අර බලන්න, “තවත් හා පැංචෙක්” හා පැටියා හා අම්මාට කිව්වා.



එත් හා පැංචා දන්නේ නෑ මේ තමන්ගේම රූපය කියලා.හා පැංචා හිතුවේ එයාට තවත් යාළුවෙක් හම්බ වුණා කියලා. එයා සතුටට විල අයිනේ එහාට මෙහාට දිව්වා.



එක පාරටම කකුල ලිස්සපු හා පැංචා “ජබොස්” ගාලා විලට වැටුණා.



ඒක දැකපු හා අම්මා කලබල වුණා. හා පැංචාට පිහිනන්නත් බෑ.දැන් කොහොමද උඩට ගන්නේ,හා අම්මා හොදටම කලබල වෙලා ඇඩුවා.විල අයිනේ හිටපු ඉබි හාමිට මේ අඩන සද්දේ ඇහුණා.



"අම්මේ මාවා බේරාගන්න" හා පැංචා කෑ ගැහුවා.හා අම්මට පීනන්නත් බෑ, හා අම්මා විල ඉවුරේ එහාට මෙහාට දුවමින් පැංචා බේරගන්න උදව් ඉල්ලමින් අඬමින් කෑ ගැහුවා.

ඉබිහාමි ඉක්මනින් හා පැංචා ළඟට පීනාගෙන ගියා.ඉක්මනින්ම හා පැංචාව එයාගේ කටුව උඩට ගත්තා.



විල ඉවුරේ හිටිය හා අම්මට පැටියා බේරාගන්න ලැබුණට හරිම සතුටුයි. ඉබි හාමි හා පැංචාව විලේ ඉවුරේ හිටිය හා අම්මට ගෙනත් දුන්නා.



හා පැංචා හොඳටම බයවෙලා ඇඬුවා. හා අම්මා පැංචාව තුරුළු කරගත්තා.හා පැංචා රැවටුනේ විලේ වතුරෙන් දැක්ක තමන්ගේම ඡායවට කියල ඉබි හාමි හා පැංචාට කියල දුන්නා.

මේ තියෙන්නේ ඔයාගෙම රූපය.බලන්න මගේ රූපයත් වතුරෙන් පේනවා.ඉබිහාමි හා පැංචාට පෙන්නුවා.



ඔහොම පොඩ්ඩක් ඉන්නකෝ අපි ගලක් ගහල බලමු.ඉබිහාමි වතුරට ගලක් දැම්මා.එතකොටම වතුර කැලතිලා එයාලගේ රූප නොපෙනී ගිය.ඒක දැකපු හා පැංචා පුදුම වුණා.



ඒ වෙන කෙනෙක් නෙවෙයි ඔයාගෙම රූපයයි.දැන් තේරුණා නේද?

"ආපහු නම් ඔහොම රැවටෙන්න එපා හා පැංචෝ" ඉබිහාමි අවවාද කළා.

හා අම්මා ඉබිහාමිට ගොඩක් ස්තුති කරමින් හා පැංචාත් එක්ක කෑම හොයාගෙන ගෙදර ගියා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්